# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2018 මැයි මස 25 වන දින

## II වන කොටස

## අතිරේකය

(2018.05.31 දින නිකුත් කරන ලදී)

**ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)**

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිල : රු. 12.00 තැපැල් ගාස්තුව : රු. 10.00

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබූ ඇතැම් මත්පැන් සඳහා ප්‍රදානය කරන ලද බදු නිදහස් කාලසීමාව සීමා කිරීම වේ.

***3 වන වගන්තිය*** : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත වගන්තියේ නීතියේ බලපෑම වනුයේ-

(අ) දේශීය වශයෙන් නිෂ්පාදිත පොල් ආශ්‍රිත නිෂ්පාදන සහ විකුණා නොමැතිව පවතින මත්පැන් තොගවලට අදාළව සහ විදුලිබලය සැපයීමට අදාළව බදු නිදහස් කිරීම් පිළිබඳ පවත්නා නිර්ණායක ප්‍රතිශෝධනය කිරීම ; සහ

(ආ) බදු නිදහස් කිරීම් ඇතැම් අලුත් අයිතම සහ ඇතැම් සේවා ආනයනය කිරීම සඳහා ද පුළුල් කිරීම වේ.

## ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන)

එල්.ඩී.—ඕ. 10/2018

**2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

*ලුහුඬු නාමය.*

**1.** මේ පනත 2018 අංක     දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

*2009 අංක 9 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.*

**2.** 2016 අංක 22 දරන පනත මඟින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු ''ප්‍රධාන ප්‍රඥප්තිය'' යනුවෙන් සඳහන් කරනු ලබන) 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනතේ 3 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියෙහි (iv) වන ඡේදයෙහි, (13) වන උපඡේදයේ ''ඒවා ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ම'' යන වචන වෙනුවට ''2018 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, ඒවා ආනයනය කරනු ලබන තැනැත්තා විසින් ම'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

*ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම.*

**3.** 2017 අංක 13 දරන පනත මඟින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) එම උපලේඛනයේ I වන කොටසෙහි–

(අ) (XLVI) යන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

"(XLVI) (අ) 2014 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් සඳහා, නිෂ්පාදකයා විසින් අලෙවි කරනු ලබන අවස්ථාවේ දී දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද පොල්තෙල්;

(ආ) 2018 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන අවුරුදු තුනක කාල පරිච්ඡේදයක් සඳහා, නිෂ්පාදකයා

විසින් අලෙවි කරනු ලබන අවස්ථාවේ දී දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද පොල් කිරි, පොල්තෙල්, පුන්නක්කු, පොල් තීරු, පොල් කටු හෝ පොල් වතුර.'';

(ආ) (L) යන අයිතමය වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:—

''(L) මෙම පනත ආරම්භ වන දිනට පෙරාතුව ම ආරම්භ වන යම් කාල පරිච්ඡේදයක් සඳහා රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ ද, අවස්ථාවෝචිත පරිදි, ආනයනය කිරීමේ දී 1962 අංක 19 දරන ආදයම් සංරක්ෂණ පනත යටතේ රේගු බදු ගෙවීමට සහ 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ සෙස් බදු ගෙවීමට යටත් වන්නා වූ හෝ නිෂ්පාදනය කිරීමේ දී (52 වන අධිකාරය වූ) සුරාබදු ආඥාපනත යටතේ සුරාබදු ගෙවීමට යටත් වන්නා වූ හා 2014 ඔක්තෝබර් මස 25 වන දිනයට පසුව නිෂ්පාදනය කරනු ලැබුවේ නම් ඉහත කී බද්දටම යටත් විය හැකිව තිබුණා වූ හා, 2014 ඔක්තෝබර් මස 25 වන දිනය වන විට විකුණා නොමැතිව පැවතියා වූ මත්පැන් තොග ද ඇතුළුව, මත්පැන්;'';

(ඇ) (LI) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:—

''(LII) කයාක්ස් ඔරු පැදීම, කයිට් සර්ෆින්ග් සහ කිමිදීම ඇතුළු ජල ක්‍රීඩා සඳහා මෝටර් මගින් ක්‍රියාත්මක නොවන උපකරණ හා උපාංග ආනයනය කිරීම;

(LIII) ආනයනය කරන අවස්ථාවේ දී රේගු කාර්ය සඳහා නිශ්චිතව සඳහන් කරන ලද ශීර්ෂ අංක යටතේ හඳුනාගනු ලැබුවා වූ එල්ලී යන ග්ලයිඩර් පැදීම, බැලුන පැදීම, පැදවිය හැකි ගුවන් යානා (ඩිරිජිබල්), පැරෂුට් පැදීම සහ පැරාග්ලයිඩර

පැදීම ඇතුළු ගුවන් ක්‍රීඩා සඳහා වන බල ගැන්වීම් නොමැති උපකරණ හා උපාංග;

(LIV) කපා ඔපදමා ප්‍රති අපනයනය කිරීමේ කාර්ය සඳහා මැණික් ගල් ආනයනය කිරීම; සහ

(LV) කෘෂිකර්මය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශය මත රාජ්‍ය මුල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද සහ එකී අයිතමයන් ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය නොකරන ලද බවට වන කොන්දේසියට යටත් ව, යම් වර්ගයක කෘෂිකාර්මික නිෂ්පාදන හෝ යම් වර්ගයක ශාක වගා කරන යම් තැනැත්තකු විසින් හරිතාගාර සහ බහු උමං සඳහා වන උපකරණ ආනයනය කිරීම සහ හරිතාගාර ඉදිකිරීම සඳහා වන ද්‍රව්‍ය ආනයනය කිරීම.'';

(2) එම උපලේඛනයේ II වන කොටසෙහි-

(අ) (ii) යන අයිතමයේ (අ) ඡේදයෙහි ''2017 අප්‍රේල් මස 1 වන දිනට පෙර කාල පරිච්ඡේදය සඳහා විදුලි බලය සැපයීම'' යන වචන සහ ඉලක්කම් වෙනුවට ''2016 නොවැම්බර් මස 1 වන දිනට පෙර කාල පරිච්ඡේදය සඳහා විදුලි බලය සැපයීම'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ආ) (xxxix) යන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:—

''(xI) 2018 අප්‍රේල් මස 1 වන දින සිට බලපැවැත්වෙන පරිදි, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ සාදනු ලැබූ නියෝග මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ ක්‍රමය මඟින් සපයන ලද යම් සේවා.''.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.